දිවි තොර කරගැනීමක් සම්බන්ධ සිදුවීම් වාර්තා කිරීමේදී ප්‍රවේසම් සහගත විය යුතු බව මාධ්‍ය මාර්ගෝපදේශයන් මගින් පෙන්වා දෙන්නේ, දිවි තොර කරගැනීම් පිළිබඳ මාධ්‍ය වාර්තා ඔස්සේ පවා, අනුකාරක දිවි තොර කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යා හැකි බැවිනි. කෙසේ නමුත්, තවමත් මාධ්‍ය මාර්ගෝපදේශයන්ට අනුගත නොවී දිවි තොර කරගැනීම් වාර්තා කරනා මාධ්‍ය ද බොහෝ තිබේ.

බදුල්ල කුට්ටියගොල්ලේ විසූ අයෙකු වංචනික විවාහයකට හසුවීමෙන් අනතුරුව දිවි තොර කරගැනීම පිළිබඳ පුවත, අරුණ (ඔක්. 12, 2022) සහ දිනමිණ (ඔක්. 13, 2022) පුවත්පත් වාර්තා කර තිබූ ආකාරය ඊට නිදසුන් ලෙසින් පෙන්වා දිය හැක.

අනුකාරක දිවි තොර කරගැනීම් වැළැක්වීමට සිය දායකත්වය ලබාදීම සඳහා, මාධ්‍ය මෙයට වඩා වගකීම් සහගත හා ආචාර ධාර්මික විය යුතු නොවේද?

උපකාරක අංකයක් සඳහන් කරමු, ජීවිතයක් රැකගනිමු!
හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

(මෙය එදින මෙම පුවත්පත් වල සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ වාර්තා වී නොතිබුණි.)

මූලාශ්‍ර:
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://media.samaritans.org/.../Guidance_for_reporting...